# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2394/51 - 2024 ජූලි මස 26 වැනි සිකුරාදා - 2024.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජනාධිපතිවරණය - 2024**

**1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

ජනාධිපතිවරයාගේ ධුර කාලය 2024 නොවැම්බර් මස 17 වැනි දින දී ඉකුත් වන හෙයින් ද,

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීම, ධුරය දරන ජනාධිපතිවරයාගේ ධුර කාලය ඉකුත් වීමට පෙර මාසයකට අඩු නොවන සහ මාස දෙකකට වැඩි නොවන කාලසීමාවක් තුළ පැවැත්විය යුතු යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වැනි ව්‍යවස්ථාවේ (3) වැනි අනුව්‍යවස්ථාවෙන් නියමිතව ඇති හෙයින් ද,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ වැනි ව්‍යවස්ථාව සමඟ කියැවෙන, 1981 අංක 15 දරන, ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 2 වැනි වගන්තියෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර :

(I) 2024 අගෝස්තු මස 15 වැනි දිනය ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා අපේක්ෂකයන්ගේ නාමයෝජනා කිරීමේ දිනය ලෙස ද ;

(II) මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය, සරණ මාවත, රාජගිරිය, එම තෝරාපත් කිරීම සඳහා අපේක්ෂකයන්ගේ නාමයෝජනා කිරීමේ ස්ථානය ලෙස ද ;

(III) 2024 සැප්තැම්බර් මස 21 වැනි දිනය එම තෝරාපත් කිරීම සඳහා ඡන්ද විමසීම පවත්වන දිනය ලෙස ද

මේ නියමය මගින් නියම කරමු.

ආර්. එම්. ඒ. එල්. රත්නායක,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

එම්. ඒ. පී. සී. පෙරේරා,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

අමීර් ෆායිස්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

ඒ. ෂන්මුගනාදන්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 ජූලි මස 26 වන දින,
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය,
සරණ මාවත, රාජගිරිය.


1A - G 42317 — 604 (2024/07)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.